// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2147/44 - 2019 ඔක්තෝබර් මස 29 වැනි අඟහරුවාදා - 2019.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු ආඥා පනත යටතේ නිවේදනයයි

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 02/2019)

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2019 ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ආර්. දේශප්‍රිය,
*වැඩබලන ලේකම්,*
මුදල් අමාත්‍යංශය.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

*යෝජනාව*

මෙම යෝජනාව *ගැසට් පත්‍රයෙහි* නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ''අ'' උපලේඛනයේ විධිවිධාන යටතේ වරණිය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණිය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බව ද මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

*උපලේඛනය*

| *ශීර්ෂ අංකය* (1) | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* (2) | | *විස්තරය* (3) | *තීරුබදු ප්‍රමාණය* *වරණිය* (4) | *සාමාන්‍ය* (5) | *ප්‍රමාණ ඒකකය* (6) |
|---|---|---|---|---|---|---|
| 27.10 | 2710.19.41 | ---- | කිලෝ ග්‍රෑම් 1 කට මිලි ග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10 ට නොවැඩි ගෙන්දගම් අඩංගු සුපිරි ඩීසල් | | ලීටරයකට රු. 15/- | කි.ග්‍රෑ. |
| | 2710.19.49 | ---- | අනෙකුත් | | ලීටරයකට 15/- | කි.ග්‍රෑ. |

11 - 1050